# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 67 දරන ශ්‍රී ලංකා පිළිකා පර්යේෂණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 නොවැම්බර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2009 නොවැම්බර් මස 17 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 4.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**2009 අංක 67 දරන ශ්‍රී ලංකා පිළිකා පර්යේෂණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2009 නොවැම්බර් මස 17 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී) — 3/2005.

**ශ්‍රී ලංකා පිළිකා පර්යේෂණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

"ශ්‍රී ලංකා පිළිකා පර්යේෂණ පදනම" යනුවෙන් හඳුන්වනු ලැබූ හා ප්‍රකට පදනමක් එකී සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව එකී පදනමේ සියලු අරමුණු හා එම පදනම හා සම්බන්ධ සියලු කාරණා සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවන ලද්දේ යම් අරමුණු හා කාරණා සඳහා ද, එම අරමුණු හා කාරණා එම පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එම පදනම සංස්ථාගත කරවා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 67 දරන ශ්‍රී ලංකා පිළිකා පර්යේෂණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පිළිකා පර්යේෂණ පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් /සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස මින් මතු ඇතුළත් කරගනු ලබන යම් හා සියලු තැනැත්තන්, ශ්‍රී ලංකා පිළිකා පර්යේෂණ පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය එයට ඇත්තේ ය. ශ්‍රී ලංකා පිළිකා පර්යේෂණ පදනම සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කරගත් පොදු පරමාර්ථ පහත දැක්වේ:—

(අ) ශ්‍රී ලංකාවේ සායන පවත්වාගෙන යන්නන්ගෙන් ආචාර ධර්මවලට අනුකූල බවට අනුමත වූ නියෝප්ලාස්මවේදය පිළිබඳ පර්යේෂණ යෝජනා භාර ගැනීම සහ පදනමේ කළමනාකරණ මණ්ඩලයේ මග පෙන්වීම සහ නිරීක්ෂණය යටතේ එවැනි පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා අරමුදල් සැපයීම;

(ආ) ශ්‍රී ලංකාවෙහි පිළිකා පිළිබඳ පර්යේෂණයෙහි නිරත පුද්ගලයන්ට හෝ සංවිධානවලට එවැනි පර්යේෂණ කරගෙන යාම පිණිස මූල්‍ය ආධාර සැපයීම;

(ඇ) මූල්‍ය ආධාර අවශ්‍ය පිළිකා රෝගීන්ට මූල්‍ය සහාය සැපයීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු, වෛද්‍ය විද්‍යාව හෝ විද්‍යාත්මක ක්ෂේත්‍රවල සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතු සංස්ථාවේ සභාපතිවරයාගෙන් සහ සාමාජිකයන් හතර දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වන කළමනාකරණ මණ්ඩලයක් විසින් පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ පදනමේ කළමනාකරණ මණ්ඩලය, සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට—

(අ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට, සංස්ථාවට අයත් අරමුදල් ආයෝජනය කිරීම;

(ආ) කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කවර හෝ බැංකුවක හෝ බැංකුවල ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යෑම සහ ගිණුම් වැසීම;

(ඈ) සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ;

(ඇ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික හෝ උපකාර විය හැකි වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම

සඳහා, බලය ඇත්තේ ය.

**6.** (1) සංස්ථාව විසින්, කලින් කල, යම් වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී හෝ මෙහි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) නිලධාරී මඩුල්ල තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ධුර කාලය, ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරය හිස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල සහ කාර්ය;

(ආ) නිලධාරී මඩුල්ල හැර කළමනාකරණ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ධුර කාලය සහ කළමනාකරණ මණ්ඩලයේ ධුර කාලය;

(ඇ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය, එහි අරමුදල්වල භාරය සහ ගිණුම් පවත්වා ගැනීම හා විගණනය;

(ඈ) කළමනාකරණ මණ්ඩලයේ යම් රැස්වීමක දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය, එහි ගණපූරණය සහ එහි වැඩකටයුතු සිදු කිරීම; සහ

(ඉ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි අරමුණු ඉටු කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන සෑම රීතියක් ම, (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි වූ රැස්වීමක දී, ඒ හා සමාන ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**7.** මිලදී ගැනීමෙන්, ප්‍රදානයකින්, තෑගි කිරීමකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ අන්‍යාකාරයකින් කවර හෝ චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙහිලා බලය හා හැකියාව ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමට පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ රීතිවලට යටත්ව එම දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ආධාර මුදල් හෝ ප්‍රදාන වශයෙන් මේ දක්වා හෝ මින්මතු ලැබෙන සියලු මුදල් සංස්ථාවේ අරමුදල වෙනුවෙන් කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව විසින් මේ පනත යටතේ එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්, සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු බව.

**9.** (1) සංස්ථාව විසින් හෝ සංස්ථාවට විරුද්ධව කවර හෝ අධිකරණයක් හමුවට ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සංස්ථාව විසින් දරනු ලබන යම් වියදමක් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සංස්ථාවට ගෙවනු ලබන හෝ සංස්ථාව විසින් අය කර ගනු ලබන යම් ගාස්තු, සංස්ථාවේ අරමුදලට බැර කළ යුතු ය.

(2) සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ කරන ලද හෝ කරන ලදැයි කියන ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් ඔහු විසින් හෝ ඔහුට විරුද්ධව කවර හෝ අධිකරණයක් හමුවට ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරනු ලබන වියදමක් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය තීරණය කළහොත්, ඒ වියදම් ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අය කර ගෙන ඇත්නම් මිස, සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් විගණනය.

**10.** (1) සංස්ථාවේ සියලු ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට සංස්ථාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු ලවා විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, එම ආයතනය විසින් නිකුත් කරන ලද ගණකාධිකාරීවරයකු ලෙස සේවයේ යෙදීමේ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තකු; හෝ

(ආ) එක් එක් නේවාසික කොටස්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු ලෙස සේවයේ යෙදීම සඳහා එම ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක සන්තකය දරන්නා වූ ද ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** සංස්ථාවේ සභාපතිවරයා සහ කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර, එකී සාමාජිකයන් විසින්, ඔවුන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් සාධන පත්‍රයෙහි ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු ය. ඔවුන් විසින් එසේ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී සංස්ථාවේ සියලු ණය හා බැරකම් නිදහස් කිරීමෙන් පසුව කිසියම් දේපළක් ඉතිරිව ඇත්නම්, එම දේපළ, සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ අරමුණු හා සමාන අරමුණු ඇත්තා වූ ද

කිසිම ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදා හැරීම රීති මගින් තහනම්ව ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට දීම හෝ ප්‍රේෂණය කිරීම හෝ කරනු ලැබිය යුතු ය. එවැනි ආයතනයක් හෝ ආයතන, සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ ඊට පෙර කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කළ හැකි ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.